www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

***සසප/ලෝසවෙඅ ගිම්හාන පාසල 2005***

# දෙවන දේශනය: විසිවන සියවස අද්දර සංශෝධනවාදයට එරෙහි ව මාක්ස්වාදය

***පලමු කොටස***

**Lecture two: Marxism versus revisionism on the eve of the twentieth century Part 1**

**ඩේවිඩ් නෝර්ත් විසිනි**
**2005 සැප්තැම්බර් 02**

*2005 අගෝස්තු මස 14 වැනිදා සිට 20 වැනි දා දක්වා මිචිගන්හි ඇන් ආර්බර්හි දී පැවැත්වුනු සමාජවාදී සමානතා පක්ෂයේ/ලෝසවෙඅ ගිම්හාන පාසැලෙහි දී ලෝක සමාජවාදී වෙබ් අඩවියේ කර්තෘ මන්ඩල සභාපති ඩේවිඩ් නෝර්ත් විසින් පවත්වනු ලැබූ "විසිවන සියවස අද්දර සංශෝධනවාදයට එරෙහි ව මාක්ස්වාදය" යන දේශනයේ පලමු කොටස යි මේ. මේ දේශනය කොටස් තුනකින් පල කෙරේ. මෙය පාසැලෙහි පැවැත්වුනු දෙවන දේශනය යි.*

## මාක්ස්වාදයේ විජයග්‍රහනය

දහනව වැනි සියවසේ අවසන් දශක තුන තුල යුරෝපීය සමාජවාදී ව්‍යාපාරයේ සහ කම්කරු පන්තිය මත මාක්ස්වාදයෙහි බලපෑමේ වර්ධනය ලෝක ඉතිහාසයේ අතිශය අසාමාන්‍ය දේශපාලන හා බුද්ධිමය ප්‍රපංචයන් අතරට අයත් වෙයි. 1849 අග භාගයේ මාක්ස් ද ඉන් පසු එංගල්ස් ද දේශපාලන සරනාගතයින් ලෙස එංගලන්තයට සම්ප්‍රාප්ත වූහ. මීලඟ දශක දෙක තුල දී මාක්ස් ධනවාදී සමාජයෙහි චලනයේ නියාම පිලිබඳ සිය න්‍යායික පර්යේෂන සිදු කලේ අතිශයින්ම දුෂ්කර පුද්ගලික වාතාවරනයක් තුල ය. 1863 ජනවාරි 8 වැනි දින මාක්ස් එංගල්ස්ට ලියූ ලිපියකින් අපට ඔහු විසින් අත්විඳින ලද තත්වය පිලිබඳ අදහසක් සැපැයේ:

"දැන් අපගේ කවයෙහි සියලු දෙනා පසුපස අන් කිසිවක් නො ව අවාසනාව ම හඹා ආ යුත්තේ මන්දැයි දන්නේ යක්ෂයා පමනි. කොයි අතකට හැරෙම්දැයි මම තවදුරටත් නොදනිමි. ප්‍රන්සයෙහි හා ජර්මනියෙහි මුදල් ඉපැයීමට මා දැරූ ප්‍රයත්න නිෂ්ඵල විය. තව ද පවුම් 15කින් සති කීපයකට වඩා නාය යාම නතර කරගත නොහැකි බව ඇතැම් විට, සත්තකින් ම පෙරදැකිය හැකි ව තිබින. මේ සතිය අවසානයේ නයට දීම නතර වනු ඇති මස්කඩකාරයා හා බේකරිය වෙනුවෙන් ඉතිරි කරන අතරම - කිසිවකුත් අපට නයට කිසිවක් ගන්ට දෙන්නේ නැතිවාට අමතර ව - පාසැල් ගාස්තු, ගෙවල් කුලී වෙනුවෙන් ද ඔවුන්ගේ මුලු රැලෙහිම කතිපින්දම් මම අසමි. පවුම් කීපයක් ගිනුම සඳහා ලබා ගන්නා අය ද ඒවා කපටි ලෙස සාක්කුවේ රුවාගන්නේ වඩාත් තදින් මට බල කිරීමට පමනි. සියල්ලට මත් වඩා ළමයින්ට එලියට යාමට ඇඳුම් හෝ සපත්තු නැත. කෙටියෙන් කියතොත්, මුලු අපාය ම ලිහා ඇරලා ය...

"මේ සන්ත්‍රාසයන් ගැන මේ මොහොතේ ඔබට කීමට තරම් මම දරුනු ආත්මාර්ථකාමියෙක්මි. එහෙත් එය හෝමියෝපතික ප්‍රතිකාරයකි. එක නස්පැත්තියක් යනු වෙනත් එකකින් ඉවත හැරීමකි. තව ද, අන්තිමේ දී මා වෙන කුමක් කරන්නද? මුලු ලන්ඩනයේ ම මගේ හිතේ ඇති දේ කීමට එක් අයෙකුදු නැත. මගේ ම ගෙදර දී මම අනෙක් පසින් එන පිපිරීම් සමබර කිරීමට නිහඬ ස්ටොයික් භූමිකාව රඟන්නෙමි. මේ තත්වයන් යටතේ වැඩ කිරීම කල නොහැකි තරම් වෙමින් පවතී"[1]

මේ ලිපිය ලිවීමට යන්තම් දින තුනකට ප්‍රථම මාක්ස්, 1867 සමාප්ත කෙරුනු ප්‍රාග්ධනය රචනා කිරීමට අත්‍යවශ්‍ය පූර්විකාවක් වූ අතිරික්ත වටිනාකම පිලිබඳ න්‍යායෝ නම් ස්මාරකීය වෙලුම් ත්‍රිත්වයේ ප්‍රධාන කොටසේ දල සටහන් සම්පූර්න කලා පමනි.

ප්‍රකාශයට පත් වීම එදවස ධනේශ්වර අර්ථශාස්ත්‍රඥයින්ගේ අවධානයට හසු නොවුනු තරම් වූ කෘතියක් වන ප්‍රාග්ධනය සම්පූර්න කිරීමෙන් අනරුව ගතවූ විසිපස් වසර තුල මාක්ස්වාදය යුරෝපයේ පලමු බහුජන පක්ෂයේ වර්ධනය උදෙසා න්‍යායික ආවේශය ද මගපෙන්වීම ද සපයා තිබිනි. මේ විජයග්‍රහනය ජර්මනියෙහි සිදු වීම වනාහි අහම්බයක් නො වේ. බුද්ධිප්‍රබෝධයේ යුගය තුල සිතිය නොහෙන තරම් දීප්තිමත් තලයකට නැඟුනු සංස්කෘතික හා බුද්ධිමය ජීවිතයකින් යුත් රටෙහි කම්කරු පන්තිය තුල මාක්ස්වාදය පලමු වරට මහාජන ශ්‍රාවකත්වයක් සොයාගති.

කාන්ට්, ෆිෂ්ටේ සහ අන් සියල්ලන්ට ම ඉහලින් හේගල් විසින් අතිශය ප්‍රගාඪ ලෙස නියෝජනය

කෙරුනු සම්භාව්‍ය ජර්මානු දර්ශනික විඥ්ඥානවාදයේ පෘථුල උරුමය 1848 විප්ලවයෙන් පසු මාක්ස් සහ එංගල්ස් හරහා කම්කරු පන්තිය තුලට ගමන් කලේ ය. සියලු විඥානවාදී ආයිත්තම් ඉවත ලූ, භෞතිකවාදී පදනමක විචාරාත්මක ව ප්‍රතිනිර්මානය කෙරුනු, ස්වභාවධර්මයෙහි මුල්බැසගත් හා මානව සමාජයේ ආර්ථික පදනම් අධ්‍යයනය කිරීමට යොමු වී ගත් එම දර්ශනවාදය, ජර්මානු කම්කරු පන්තියේ විමුක්තිය වෙනුවෙන් ඉටු කිරීමට නියමිත අත්‍යසාමාන්‍ය භූමිකාව මාක්ස් සත්තකින් ම පෙරදැක තිබුනේ ය. ඔහු 1843 දී මෙසේ ලිවී යෑ:

"විවේචන අවිය, සත්තකින් ම, විවේචනය අවිවලින් විස්ථාපනය කරනු බැරි ය, ද්‍රව්‍යමය බලවේගය මුලිනුපුටා දැමිය යුත්තේ ද්‍රව්‍යමය බලවේගය මගිනිත එහෙත් න්‍යාය ද, එය ජනකාය සිය ග්‍රහනයට ගත් වහා ම ද්‍රව්‍යමය බලවේගයක් බවට පෙරලෙයි.[2]

"දර්ශනවාදය සිය *ද්‍රව්‍යමය* අවි නිර්ධන පන්තිය තුල සොයාගන්නා අතර නිර්ධන පන්තිය සිය *ආධ්‍යාත්මික* අවි දර්ශනවාදය තුල සොයාගනියි... *ජර්මානුවාගේ විමුක්තිය වනාහි මානව වර්ගයාගේ විමුක්තිය* වන්නේ ය. මේ විමුක්තියේ හිස දර්ශනවාදයයි, එහි හදවත නිර්ධන පන්තිය යි. දර්ශනවාදය යථාර්ථයක් බවට පත් කරලීම නිර්ධන පන්තිය අහෝසි කිරීමෙන් තොර ව කල නොහැකි යත නිර්ධන පන්තිය අහෝසි කරලීම දර්ශනවාදය යථාර්ථයක් බවට පත් කිරීමෙන් තොර ව කල නොහැකි ය"[3]

මේ ඡේදය ලියනු ලැබුවේ, මාක්ස් හේගල්ගේ විඥ්ඥානවාදී දර්ශනය පිලිබඳ සිය විචාරය දියත් කරමින් සිටිය දී ම ය. හේගල්ගේ විඥ්ඥානවාදී පද්ධතියේ තාර්කික හරය උකහා ගැනීම, එනම් හේගල් විසින් ස්ව-පරත්වාරෝපනය සහ පරම චෛතන්‍යයෙහි ප්‍රතිසංස්කරනය හැටියට ග්‍රහනය කරගත් ප්‍රවර්ග හා සංකල්ප පිලිබඳ අපෝහකය, භෞතිකවාදී පදනමක යලි නිමැවීම, දැවැන්ත පරිමානයේ න්‍යායික-බුද්ධිමය සාක්ෂාත් කිරීමකින් සමන්විත විය. කෙසේ වතුදු, හේගලියානුවාදය සමතික්‍රමනය කිරීම සමපේක්ෂනාත්මක චින්තනයේ සිර කුටිය තුල පැවැතියා වූ විචාරයක් මගින් සාක්ෂාත් කල නොහැකි විය. මාක්ස්ට පෙර, ජර්මානු දර්ශනවාදී ෆොයබාක් හේගලියානුවාදය පිලිබඳ භෞතිකවාදී විචාරයකට පදනම දමා තිබුනේ ය. එහෙත් ෆොයබාක්ගේ විචාරයේ ශක්තිය, ඔහුගේ භෞතිකවාදයෙහි ප්‍රධාන වශයෙන් පැවති ස්වාභාවිකවාදී හා යාන්ත්‍රික වූ ස්වරූපය මගින් සීමා කෙරිනි. ෆොයබාක් විසින් දාර්ශනික ව ග්‍රහනය කරගැනුනු "මිනිසා" ජීවත් වූයේ ඉතිහාසය තුල නො ව ස්වභාවධර්මය තුල ය. එවැනි අනෛතිහාසික සත්වයකුට සකලවිධ සමාජීය සංයුක්තතා අහිමි විය.

එනයින්, චින්තනයට ඉහලින් ද්‍රව්‍යයේ ප්‍රාථමිකත්වය ගැන අවධාරනය කරමින් පවා, මේ පදනම මත මානව විඥ්ඥානයේ රූපාකාරයන්ගේ සංකීර්නත්වය හා විවිධත්වය පැහැදිලි කිරීමට ෆොයබාක්ට හැකි නො වී ය. වෙසෙසින් ම මනුෂ්‍ය වර්ගයාගේ ඓතිහාසික වර්ධනය තුල දී ප්‍රකාශයට පත් වන විඥ්ඥානයේ වෙනස් වීම් ගැන පැහැදිලි කිරීමක් සම්පාදනය කිරීමට ඔහු අසමත් විය.

1770 දී හේගල් ද 1804 දී ෆොයබාක් ද උපත ලද යුරෝපය සහ ජර්මනිය, ප්‍රන්ස විප්ලවයේත් නැපෝලියානු යුද්ධවලත් සංක්ෂෝභය විසින් වෙනස්වීම්වලට භාජනය කරනු ලැබිනි. එහෙත් එවැනි සිදුවීම් පැහැදිලි කල හැක්කේ කෙසේ ද? ඒවා සරල ව ම නිදහස, සමානාත්මතාව හා සහෝදරත්වය පිලිබඳ පරමාදර්ශයන්ගේ නිෂ්පාදන ද? මේ පරමාදර්ශයන්ගේ බලගතුභාවය කෙනෙකු පිලිගත්ත ද, ඒවා පැමිනියේ කොහි සිට ද? හේගල් විසින් සම්පාදිත පිලිතුර, එනම් මේ පරමාදර්ශ පරම චෛතන්‍යයෙහි ස්ව-පරත්වාරෝපනය තුල තාර්කික ව නිර්නය කෙරුනු නිමේෂයන් හැටියට පැන නැංගේ ය යන්න, සංයුක්ත ඓතිහාසික ක්‍රියාවලීන් පිලිබඳ පැහැදිලි කිරීමක් වසයෙන් සපුරා ම අප්‍රමානවත් විය. *සමාජ විඥ්ඥානයේ* සම්භවය හා වර්ධනය භෞතිකවාදී පදනමක සිටිමින් සොයාගත හැකි වූයේ *සමාජීය සත්වයකු* ලෙස මිනිසාගේ ඉතිහාසය පිලිබඳ කෙරුනු අධ්‍යයනයක පදනම මත පමනි.

1844 හා 1847 අතර අසාමාන්‍ය තුන් අවුරුද්දක් තුල මාක්ස් සහ එංගල්ස් විසින් ඉතිහාසය පිලිබඳ භෞතිකවාදී සංකල්පනයෙහි සාරාර්ථී මූලිකාංග වර්ධනය කරන ලදි. එම කාලය තුල දී ඔවුහු *ශුද්ධ වූ පවුල*, *ජර්මානු දෘෂ්ටිවාදය*, *දර්ශනවාදයේ දුගීභාවය* සහ අවසාන වසයෙන් *කොමියුනිස්ට් ප්‍රකාශනය* රචනා කලහ. මීලඟ විසිවසර තුලදී ප්‍රාග්ධනය ලිවීම මගින් පලදැරූ දේශපාලන ආර්ථිකය පිලිබඳ මාක්ස්ගේ හැදෑරීම්, විශ්ලේෂනය පිලිබඳ අපෝහක විධික්‍රමය ද ඉතිහාසය විෂයයෙහි භෞතිකවාදී සංකල්පනය ද යන දෙකෙහි ම න්‍යායික අන්තර්ගතය සම්පාදනය කලේ ය. දේශපාලන අර්ථශාස්ත්‍රය පිලිබඳ මාක්ස්ගේ වැඩකටයුතු ඉතා මත් වර්ධිත තලයකට ලඟා වී තිබුනු 1859 දී ඔහු සිය න්‍යායික කටයුතුවල "මාර්ගෝපදේශක මූලධර්මය" සාරාංශගත කලේ පහත දැක්වෙන පරිදි යෑ:

"සිය පැවැත්ම සමාජීය ව නිෂ්පාදනය කරගැනීමේ දී මිනිස්සු ඔවුන්ගේ අභිලාෂයන්ගෙන් ස්වාධීන වූ නිශ්චිත සබඳතාවන්ට, නාමික ව කියතොත් ඔවුන්ගේ ද්‍රව්‍යමය නිෂ්පාදන බලවේගයන්ගේ වර්ධනයෙහි දෙන ලද අදියරකට උචිත නිෂ්පාදන සබඳතාවන්ට අනිවාර්යයෙන් ම එලඹෙති. සමාජයේ ආර්ථික ව්‍යුහය මේ නිෂ්පාදන සම්බන්ධතා සමස්තයෙන් සමන්විත වෙයි. සමාජයේ සැබෑ පදනම වන මෙයින් නෛතික හා දේශපාලනික උපරි ව්‍යුහයක් පැන නගින අතර සමාජ විඥ්ඥානයේ නිශ්චිත රූපාකාර එයට අනුරූප වෙයි. ද්‍රව්‍යමය ජීවිතයෙහි නිෂ්පාදන මාදිලිය, සමාජීය,

දේශපාලනික හා බුද්ධිමය ජීවිතයේ සාමාන්‍ය ක්‍රියාවලිය සකස් කරයි. මිනිසුන්ගේ විඥ්ඥානය විසින් ඔවුන්ගේ පැවැත්ම නිර්නය කෙරෙනවා නො ව ඔවුන්ගේ සමාජීය පැවැත්ම විසින් ඔවුන්ගේ විඥ්ඥානය නිර්නය කෙරේ. වර්ධනයේ එක්තරා අදියරක දී සමාජයේ ද්‍රව්‍යමය නිෂ්පාදන බලවේග පවතින නිෂ්පාදන සබඳතා සමග නැතහොත් (මෙය හුදෙක් එය ම නෛතික පද වලින් ප්‍රකාශ කරයි) ඒවා මේ දක්වා ක්‍රියාත්මක වූ රාමුවෙහි දේපල සම්බන්ධතා සමග ගැටෙන්නට පටන් ගනී. මෙකී සම්බන්ධතා, නිෂ්පාදන බලවේගයන්ගේ වර්ධනයේ රූපාකාරවල සිට නිෂ්පාදන බලවේගවල විලංගු බවට පරිවර්තනය වේ. එකල්හි සමාජ විප්ලවය පිළිබඳ සමයක් ඇරඹෙයි. ආර්ථික පදනමෙහි හටගන්නා වෙනස් වීම් ඉක්මනින් හෝ පසු ව හෝ මුලු මහත් උපරි ව්‍යුහයෙහි ම පරිවර්තනයකට තුඩු දෙයි. එවැනි පරිවර්තනයන් අධ්‍යයනය කිරීමේ දී සෑම කල්හි ම ස්වාභාවික විද්‍යාවන් සතු නිශ්චිතතාවෙන් යුක්ත ව නිර්නය කල හැකි නිෂ්පාදනයේ ආර්ථික කොන්දේසිවල ද්‍රව්‍යමය පරිවර්තනය ද නෛතික, දේශපාලනික, ආගමික කලාත්මක හෝ දාර්ශනික, කෙටියෙන් කියතොත් මිනිසුන් මෙකී ගැටුම පිළිබඳ සවිඥ්ඥානිකත්වය ලබාගන්නා හා එය සමග සටන් කොට විසඳාගන්නා දෘෂ්ටිවාදාත්මක රූපාකාරයන් ද, අතර වෙනස සනිටුහන් කරගැනීම අවශ්‍ය ය. යම් පුද්ගලයකු තමන් ගැන ම සිතන දෙය මගින් කෙනෙකු ඔහු විනිශ්චයට ලක් නොකරන්නේ යම් සේ ද කෙනෙකුට පරිවර්තනය පිළිබඳ වකවානුවක් එහි ම විඥ්ඥානයෙන් විනිශ්චය කල නො හැකි ය. එහෙත් ඊට ප්‍රතිපක්ෂ ව මේ විඥ්ඥානය පැහැදිලි කල යුතු වන්නේ ද්‍රව්‍යමය ජීවිතයේ ප්‍රතිවිරෝධතා මගිනි, නිෂ්පාදනයේ සමාජ බලවේග හා නිෂ්පාදන සම්බන්ධතා අතර පවත්නා ගැටුම මගිනි."[4]

ආසන්න වසයෙන් 150 වසරකට පසු පවා, මේ ඡේදයෙහි ඉදිරිපත් කෙරෙන සත්භාවාත්මක හා ඥානවිභාගාත්මක මූලධර්මවල විනිවිදිනසුලු බලය අතිමහත් ය. ඉතිහාසයේ ගාමක බලවේග ද සියලු සංකීර්න රූපාකාරයන් තුල මානව සමාජ විඥ්ඥානයේ පදනම ද පිළිබඳ මාක්ස්ගේ විස්තාරනය සමග එක ලඟ තබා කියවන කල්හි පශ්චාත් නූතනවාදයේ නරුම අභ්‍යුපගමයන් පෙනෙන්නේ මොන තරම් නම් අල්ප, බුද්ධිමය වසයෙන් නොමේරූ සහ, නිකම් ම කියතොත්, මොට්ට ස්වරූපයකින් ද? 1859 වසරේ අනිත් විස්මයජනක ජයග්‍රහනය, එනම් ඩාවින්ගේ *ජීව විශේෂයන්ගේ සම්භවයෝ* සේ ම මාක්ස් සිය *දේශපාලන අර්ථශාස්ත්‍රය පිළිබඳ විචාරයට සම්ප්‍රදානයක්* කෘතියට ලියූ ආමුඛයෙහි දී ඉදිරිපත් කල න්‍යායික සංකල්පනා ද මනුෂ්‍ය වර්ගයාගේ බුද්ධිමය ජීවිතයෙහි තීරනාත්මක සැතපුම් කනුවක් සලකුනු කලේ ය. සත්තකින් ම, මේ කෘති දෙක අතර ප්‍රගාඪ වූ අභ්‍යන්තර සම්බන්ධතාවක් පවතී. එය වනාහි සරල ව ම මේ කෘති මගින් මාක්ස් ඉතිහාස අධ්‍යයනය ද ඩාවින් ජෛව විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනය ද සදහට ම පරිවර්තනය කිරීම යන කරුන නො වේ.

එය, සැබැවින් ම සත්‍යයකි. එය සුලුපටු ජයග්‍රහනයක් නො වේ. එහෙත් මේ කෘති ඊටත් වඩා යමක් වෙයි. 1859 වන විට ඩාවින්ගේ හා මාක්ස්ගේ කෘති තුලින්, මනුෂ්‍ය වර්ගයා අවසානයේ දී තමන්ගේ ම ජීව විද්‍යාත්මක හා සමාජ ආර්ථික වර්ධනයේ නීති-පරිපාලිත ක්‍රියාවලිය අවබෝධ කරගැනීමට සමත් තැනට සම්ප්‍රාප්ත විය. මේ දක්වා අවිඥ්ඥානික වූ තමන්ගේ ම ජීවවිද්‍යාත්මක හා සමාජීය පරිනාමයට සවිඥ්ඥානික ව මැදිහත් වීමේ බුද්ධිමය අවශ්‍යතාව දැන් පැන නැඟ තිබිනි.

*මතුසම්බන්ධයි*

## සටහන්

[1] Marx and Engels *Collected Works*, (මාක්ස් සහ එංගල්ස්, එකතු කල කෘති), 41 වන වෙලුම, (නිව් යෝර්ක්: ඉන්ටර්නැශනල් පබ්ලිශර්ස්, 1985), 442 පි.

[2] Marx and Engels, *Collected Works*, (මාක්ස් සහ එංගල්ස්, එකතු කල කෘති), 3 වන වෙලුම, (නිව් යෝර්ක්: ඉන්ටර්නැශනල් පබ්ලිශර්ස්, 1975), 182 පි.

[3] එම, 187 පි.

[4] Preface to *A Contribution to the Critique of Political Economy*, *Collected Works*, (දේශපාලන අර්ථශාස්ත්‍රය පිළිබඳ විචාරයට සම්ප්‍රදානයට පෙරවදනක්, එකතු කල කෘති), 29 වන වෙලුම, (නිව් යෝර්ක්: ඉන්ටර්නැශනල් පබ්ලිශර්ස්, 1987), 263 පි.

© www.wsws.org